පළමුවෙනි සභාපතිත්වයේ පණිවුඩය, ජනවාරි 2016



**සභාපති හෙන්රි බී. අයිරින් විසිනි**
පළමුවෙනි සභාපතිත්වයේ
පළමුවෙනි උපදේශකවරයා

# අප ප්‍රේමකරන අයගේ සතුට සඳහා

අප සියලු දෙනාටම අවශ්‍ය අප ප්‍රේමකරන අය සතුටින් සිටීම වන අතර, අපට අවශ්‍ය ඔවුන්ගේ වේදනාව හැකි තරම් අඩුවීමය. මෝර්මන්ගේ පොතේ එන සතුට — සහ වේදනාව—ගැන කථා ගැන සිතන විට, අපගේ හදවත් කැළඹීයයි. ප්‍රීතිමත් අවස්ථාවක් ගැන කියවෙන සත්‍ය විස්තරයක් මෙන්නඃ

"තවද එය මෙසේ සිදුවිය, එනම්, දෙවියන්වහන්සේගේ ප්‍රේමය ජනතාවගේ හදවත් තුල තිබුන හෙයින්, එහි දේශයේ විවාදයක් නොවීය.

"තවද එහි ඊර්ෂ්‍යාව නොවීය, කළහය නොවීය, උද්ඝෝෂනයන් නොවීය, වේශ්‍යාකම් නොවීය, බොරුකීම නොවීය, මිනීමැරීම් නොවීය, කිසිම ආකාරයක සල්ලාලකම් නොවීය, තවද සත්‍යයෙන්ම එහි දෙවියන්වහන්සේගේ හස්තයෙන් මවනු ලැබුවාවූ සියලුම ජනතාව අතර වෙනත් ප්‍රීතිමත් ජනතාවක් සිටිය නොහැකිය."

ඉන්පසුව අපි මෙසේ කියවමුඃ

"තවද ඔවුන් කෙතරම් ආශිර්වාද ලද්දේද! මක්නිසාද දෙවියන්වහන්සේ ඔවුන්ට ඔවුන්ගේ සියලු ක්‍රියාවලදී ආශිර්වාද කළසේක. එසේය, ඔවුහු වසර එකසිය දහය වන තුරු පවා ආශිර්වාදිතවී තවද සමෘද්ධිමත් වූහ; තවද ක්‍රිස්තුස්වහන්සේගේ සිට, පළමු පරම්පරාව මරණයට පත්විය, තවද එහි සියලු දේශයේ විවාද නොවීය" (4 නෙපී 1:15–16, 18).

ක්‍රිස්තුස්වහන්සේගේ ආදරණීය ගෝලයෝ අන් අයට සහ තමන් සඳහාද එවැනි ආශිර්වාදයක් වෙනුවෙන් යාච්ඤාකරමින් කටයුතුකරති. මෝර්මන්ගේ පොතේ විස්තරයෙන්, අප බොහෝ දෙනෙක් සඳහා, අපගේම අත්දැකීම් වලින්, සතුටේ දීමනාව ලබාගතහැකි බව අපි දන්නෙමු. සතුටට මාර්ගය හොඳින් සළකුණුකර ඇති බව අපි දනිමු. ගැලවුම්කරුවාණන්ගේ බැහැදැකීමෙන් පසුව, "දෙවියන්වහන්සේගේ ප්‍රේමය" අත් විඳි නෙපීවරුන් මෙන්, කටයුතු කිරීමෙන් තොරව, සතුට පවත්වාගෙන යාම පහසු නොවේ,

එම ප්‍රේමය නෙපීවරුන්ගේ සිත්වල තිබුනේ, එයට හැකියාව ලබාදුන් ව්‍යවස්ථාව ඔවුන් තැබූ නිසාය. එම ව්‍යවස්ථාවේ සාරාංශයක් සක්‍රමේන්තු යාච්ඤාවේ ඇත. එය ආරම්භවන්නේ අපගේ ආදරණීය ස්වර්ගික පියාණන්වහන්සේට අයාචනයකිනි. අපි අපගේ පුද්ගලික ගැලවුම්කරුවාණන් වහන්සේට, ඇදහිල්ල පිරිණු සිතකින් සහ ගැඹුරු ප්‍රේමයකින් යුතුව යාච්ඤාකරන්නෙමු. අපි සැබෑ ඕනෑකමකින්, උන්වහන්සේගේ නාමය අප වෙතට ගෙන, උන්වහන්සේව සිහිපත්කරමින්, උන්වහන්සේගේ පණත් ආරක්ෂාකිරීමට කැපවන්නෙමු. අවසානයේදී, ශුද්ධාත්මයාණන්වහන්සේ, දේව ශීර්ෂයේ තුන්වන සාමාජිකයා, නිතරම අප සමග සිටින බවට පියාණන්වහන්සේ සහ උන්වහන්සේගේ ආදරණීය පුත්‍රයාණන් ගැන අපගේ හදවත්වලට සාක්ෂිදරන්නෙමු. (බලන්න ඩීසහගී 20:77, 79.)

ශුද්ධාත්මයාණන්වහන්සේගේ මිත්‍රත්වය සමග, පචෘවට්තින්නේ සිත් වෙනස්වන නිසා, අපගේ ස්වර්ගික පියාණන්වහන්සේගේ සහ ස්වාමීන්වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය පිළිගැනීමට අපට අවශ්‍යවන්නේය. දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වලට ගැනීමේ මාර්ගය, අපගේ

හදවත්වලින් එම ප්‍රේමයේ හැඟීම නැතිකිරීමේ මාර්ගය මෙන් සරලය. උදාහරණයක් ලෙස, යමෙක් හට ස්වර්ගික පියාණන්වහන්සේට අඩුවෙන් යාච්ඤාකිරීමට හෝ සම්පූර්ණ දසයෙන් කොටස නොගෙවීමට හෝ දෙවියන්වහන්සේගේ වචනයෙන් සතුටුවීම නැවැත්වීමට හෝ දුප්පතුන් සහ උපකාර අවශ්‍යවන අය නොකළකාහැරීම හෝ තෝරාගත හැකිය.

ස්වාමීන්වහන්සේගේ පණත් අරක්ෂා නොකිරීමට ගන්නා ඕනෑම තේරීමක්, අපගේ හදවත්වලින් ආත්මයාණන් වහන්සේ අස්කරගැනීමට හේතුවිය හැකිය. එම අහිමිවීමත් සමග සතුටද හීනවීයන්නේය.

අප ආදරයකරන අය සඳහා අප සොයන සතුට රඳාපවතින්නේ ඔවුන්ගේ තෝරාගැනීම අනුවය. අප දරුවෙකුට, සොයාබලන්නෙකුට හෝ අපගේ මිතුරෙකුට හෝ ආදරය කරන ප්‍රමාණයට,පණත් තැබීමට ඔවුන්ට බලකිරීමට අපට නොහැකිය, එවිට ඔවුන්ගේ ජීවිත ශුද්ධාත්මයාණන්වහන්සේ ස්පර්ශකර වෙනස්කිරීම සඳහා ඔවුන් සූදුසුවනු ඇත.

එනිසා අපට ඔවුන්ට දිය හැකි හොඳම උපකාරය නම්, අප ප්‍රේමකරන අයට ඔවුන්ගේම තෝරාගැනීම් ගැන සොයා බැලීමය, ඇල්මා එය කළේ ඔබට පිළිගැන්විය හැකි ආරාධනාවක් සමගය:

"එහෙත් එනම් නුඹලා ස්වාමීන්වහන්සේ ඉදිරියේ නුඹලාවම යටහත්කරගෙන, තවද උන්වහන්සේගේ ශුද්ධවූ නාමයෙන් යාච්ඤාකරමින්ද, විමසිල්ලෙන් සිටිමින්, නිතර යාච්ඤාකරන්න. එනම් එය නුඹලාට ඉසිලිය හැකි දෙයට ඉහළින් පරීක්ෂාවට පත් නොවන පිණිසය, තවද ශුද්ධාත්මයාණන්ගෙන් මෙසේ මගපෙන්වීම ලබමින්, යටහත්ව, නිහතමානී, යටහත් පහත්ව, ඉවසිලිවන්තව, සම්පූර්ණ ප්‍රේමයෙන්ද, දිගු දරාගැනීමෙන්ද යුක්තව සිටින්න;

"ස්වාමීන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඇතිව; එනම් නුඹලා සාදාතන ජීවනය ලබාගන්නේයයි බලාපොරොත්තු ඇතිව, දෙවියන්වහන්සේගේ ප්‍රේමය සැමවිටම නුඹලාගේ හදවතේ තබාගෙන, එනම් නුඹලා අවසාන දවසේ නැගිටිමින් තවද උන්වහන්සේගේ විශ්‍රාමයට ඇතුල්වන්න" (ඇල්මා 13:28–29).

ඔබ ප්‍රේමකරන අයට පවතින සතුටක් ලබාගැනීමේ මාර්ගය තෝරාගැනීමට ප්‍රබෝධමත් ආරාධනාවක් පිළිගැනීමට හැකිවේවායි මම යාච්ඤාකරමි,

### මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

අප ජීවිතයේ අත්විඳින සතුට රඳාපවතින්නේ අප ගන්නා තීරණවලට අනුව බව සභාපති අයිරින් උගන්වයි. ඔබ මෙම පණිවුඩය සාකච්ඡාකරන විට, සභාපති අයිරින් සඳහන්කළ, එම සතුටේ මාර්ගයට අපට මගපෙන්වීමට, යාච්ඤාකිරීම, වැඩකිරීම, ඇදහිල්ල ක්‍රියාත්මක කිරීම, සැබෑ බලාපොරොත්තුවකින් අප කැපවීම වැනි, අප කිරීමට තෝරාගන්නා දේවල් ගැන සිතාබැලීමට සලකාබලන්න. "කල්පවත්නා සතුටේ මාර්ගයට" ඔබ උගන්වන අයට හොඳින් මගපෙන්විය හැකි ඔවුන් කැමති ක්‍රියා දෙකක් හෝ තුනක් ලිවීමට ඔවුන්ට ආරාධනා කරන්න.

## තරුණඅය

### සතුටට මගපෙන්වන ක්‍රියා

"අපට අවශ්‍යවන අප ප්‍රේමකරන අයගේ සතුට රඳාපවත්නනේ ඔවුන්ගේ තේරීම් මත බව" සභාපති අයිරින් උගන්වයි.

එම තේරීම්වලින් ලැබිය හැකි ප්‍රතිඵල ගැන නෙෆී, ලාමන්, සහ ලෙමුවෙල්ගේ අත්දැකීම්වලින් කියවීමට ඔබට පුළුවන. ලේමන් සහ ලැමුවෙල් මැසිවිලි නැගූ අතර, පණත් ආරක්ක්ෂාකිරීම ඔවුන්ට අවශ්‍ය නොවීය (බලන්න 1 නෙෆී 2:12). එහි ප්‍රතිඵලයක් ලෙස, ඔවුන් සහ ඔවුන්ගෙන් පැවතෙන්නන්ද, ශාපකරනු ලැබ, ස්වාමීන් වහන්සේගේ සම්මුඛයෙන් කපාහරින ලදී (බලන්න 2 නෙෆී 5:20–24).නෙෆී පණත් තැබීම තෝරාගත්තේය (බලන්න 1 නෙෆී 3:7) තවද එම හේතුව නිසා, ඔහු සහ ඔහුනේ ජනතාව "ප්‍රීතිමත් ආකාරයෙන් ජීවත්වූහ" (2 නෙෆී 5:27).

ධර්මිෂ්ටව, සතුටින් ජීවත්වීම තෝරාගැනීමට ඔබට හැකිය, නුමුත් ඔබ වටා සිටින අය තවදුරටත් දුක්ඛිතකම සහ අපහසු දුර්වල තේරීම් තෝරාගත හැකිය. එම තීරණ ගැනීම ඔවුන් සතුවූවක් නිසා, ඔබගේ ආදර්ශය, යහපත් තේරීම් ගැනීමට ඔවුන්ට බලපෑමක්විය හැකිය. ඔබගේ තේරීම් අන් අයට සතුට ගෙනඑන්නේ කෙසේද? ඔබ වටා සිටින අයට සතුට අත්විඳීමට සුභවාදී බලපෑමක් කිරීමට ඔබට හැකි විවිධ මාර්ග ගැන ඔබගේ පවුල සමග සාකච්ඡාකරන්න.

## ළමයි

### කරුණාවන්ත අභියෝගය

යේසුස්වහන්සේ අමෙරිකාවේ ජනතාව බැහැදුටුවිට, එකිනෙකාට ප්‍රේමකරමින්, කරුණාවන්තවීමට උන්වහන්සේ ඔවුන්ට ඉගැන්වූසේක. යේසුස්වහන්සේ අනුගමනයකරමින් අන් අයට ප්‍රෙමකිරීමට ඔබට කල හැකි දේවල් මොනවාද? අදහස් කිහිපයක් මෙහි දැක්වේ. ඔබ යන විට හැම අභියෝගයක්ම සම්පූර්ණකරන්න.

❑ කණගාටුවෙන් සිටින යමෙක් වැළඳගැනීමට මට පුළුවන
❑ යමෙකුට රහසින් සේවයකිරීමට මට පුළුවන.
❑ කාරුණිකවීම ගැන කථාකරන සම්මන්ත්‍රණයක් බැලීමට හෝ කියවීමට මට පුළුවන.
❑ ප්‍රාථමික ගීතයක් මගේ පවුලට ගායනාකිරීමට මට පුළුවන.
❑ හුදකලාව සිටින බව පෙනෙන අයෙක් සමග සිනහසීමට මට පුළුවන.
❑ මට පුළුවන ______________________________.
❑ මට පුළුවන ______________________________.

© 2016 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. අඑජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/15. පරිවර්තන අනුමැතිය 6/15. *First Presidency Message, January 2016* පරිවර්තනයයි. Sinhala. 12861 408

# පවුල: ලෝකයාට ප්‍රකාශනයකි

*මෙම ලිපිය යාච්ඤාවෙන් යුතුව කියවා බෙදාගන්නේ මොනවාදැයි සොයන්න. බැහැදැක ඉගැන්වීම තුලින් ඔබ සොයාබලන අය, පවුල පිළිබඳ දහම අවබෝධවීමෙන් ආශිර්වාදිත වන්නේ කෙසේද? වැඩිදුර තොරතුරු සඳහා යන්න, reliefsociety.lds.org*

ඇදහිල්ල, පවුල, සහනය

1995 ප්‍රධාන සහන සමිති රැස්වීමේදී, සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලි (1910-2008) "පවුලඃ ලෝකයාට ප්‍රකාශනයකි," පළමුවර කියවූවිටදී, බොනී ඒ, ඔස්කාසන්, තරුණ කාන්තා ප්‍රධාන සභාපතිනිය, මෙසේ කීවායඃ "මෙම එළිදරව් ලිපියේ පැහැදිළිබව, සරළබව සහ සත්‍යය අපි කෘතඥපූර්වකව අගයකරන්නෙමු. … පවුල ගැන ප්‍රකාශනය ලෝකයේ දර්ශනවාදය නිශ්චයකිරීමේ අපගේ මිණුම් දණ්ඩ බවට පත්ව ඇති අතර, එහි අඩංගු මූලධර්ම … වසර 20කට පෙර දෙවියන්වහන්සේගේ අනාගතවක්තවරයෙක් විසින් එය අපට මුලින් දුන් විට තිබූ පරිදිම, අදටත් සත්‍ය බවට මම සාක්ෂිදරමි."[1]

"පවුල් ප්‍රකාශනයෙන්," යයි කැරොල් එම්. ස්ටීවන්සන්, සහන සමිතියේ ප්‍රධාන සභාපතිත්වයේ පළවෙනි උපදේශිකාව මෙසේ කීවාය, "'මැරෙන සුළු ජීවිතයට පෙර ජීවිතයේ, ආත්මික පුතුන් සහ දියණියන්, දෙවියන්වහන්සේ ඔවුන්ගේ සදාකාලික පියාණන්වහන්සේ බව ලෙස, දැනගෙන නමස්කාරකළ බව අපි ඉගෙනගන්නෙමු'[2] …

"… අප හැම කෙනෙක්ම දෙවියන්වහන්සේගේ පවුලට අයත්වන මෙන්ම අවශ්‍යවනද අයයි."[3]

අප ජීවත්වන්නේ දෙමාපියන් විසින් ඔවුන්ගේ නිවාස සහ ඔවුන්ගේ පවුලක් ආරක්ෂාකළ යුතු කාලයකය. "පවුලඃ ලෝකයාට ප්‍රකාශනයකි" අපට මගපෙන්වීමට එයට පුළුවන.

### *අමතර ශුද්ධ ලියවිලි*

මොසායා 8:16–17; දහම සහ ගිවිසුම 1:38

### *ජීවත්වන අයගේ කථාන්තර*

"ටාෂි යුවාන් තුන්වෙනි කොට්ඨාශයේ, ටා ඕ යුවාන් තායිවාන් ස්ටෙකයේ, ලී මෙයි වෙන් හෝ ට ඇදහිල්ල, ඉවසීම, සහ ප්‍රේමය වැනි දිව්‍යමය ගුණාංග වර්ධනයකරගැනීමට පවුල් සම්බන්ධතාවයන් උපකාරවත්වන බව පවුල් ප්‍රකාශනය ඇයට උගන්වා ඇති බව කීවාය. 'ප්‍රකාශනයට අනුව වැඩිදියුණුවීමට මා උත්සාහකරන විට, සැබෑ සතුට අත්විඳීමට මට පුළුවන,' යයි ඇය කීවාය."[4]

ප්‍රකාශනය පළමු වරට කියවූවිට එය අසා සිටි, පසුව සහන සමිතියේ ප්‍රධාන සභාපතිත්වයේ උපදේශිකාවක් ලෙස සේවය කළ බාබරා තොම්ප්සන්, මෙසේ කීවායඃ "මා විවාහවී නොමැති නිසාත්, මට දරුවන් කිසිවෙක් නොමැති නිසාත්, [පවුල් ප්‍රකාශනය] සැබවින්ම මට එතරම් අදාළ නොවන බව, මම මොහොතක් සිතුවෙමි. නමුත් ඉතාමත්ම ඉක්මණින් මට මෙසේ සිතුනි, 'නුමුත් මට එය අදාළවේ. මම පවුලක සාමාජිකාවක් වෙමි. මම පවුලේ ජීවත්වන එකම සාමාජිකාව වුවද. … මම දියණියකි, සොහොයුරියකි, නැන්දනියකි, ඥාති සහෝදරියකි, ලේලියකි, එසේම මිනිපිරියක්ද වෙමි, මම තවමත් දෙවියන්වහන්සේගේ පවුලේ සාමාජිකාවක් වෙමි.'"[5]

**සටහන්**

1. බොනී එල්. ඔස්කාසන් "Defenders of the Family Proclamation," ලියහෝනා, මැයි 2015, 14–15.
2. "පවුලඃ ලෝකයාට ප්‍රකාශනයකි," ලියහෝනා, නොවැ. 2010, 129.
3. කැරොල් එම්. ස්ටීවන්ස්, "The Family Is of God," ලියහෝනා, මැයි 2015, 11.
4. නිකොලේ සීමෝර්, 'The Family: A Proclamation to the World' reaches 10-Year Milestone, ලියහෝනා, නොවැ. 2005, 127.
5. බාබරා තොම්ප්සන්, *Daughters in My Kingdom: The History and Work of Relief Society* (2011), 148.

### *මේ ගැන සිතාබලන්න*

පවුල: ලෝකයාට ප්‍රකාශනයකි, එය අපේ කාලයේ ලියවිල්ලක් වන්නේ කෙසේද?

© 2016 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ඇළ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතියඃ 6/15. පරිවර්තන අනුමැතිය 6/15.
*Visiting Teaching Message, January 2016* පරිවර්තනයයි. Sinhala. 12861 408